00046
THE OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
අවසාන පරීක්ෂණය -2010/2011

**ESP 1137 – පුනරුත්ථාපනය හා ප්‍රජාමූලික පුනරුත්ථාපනය**

කාලය පැය තුනයි.

---

දිනය - 2012 මැයි මස 26 වන දින වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද, දෙවන කොටසින් තෝරාගත් ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

<u>I වන කොටස</u>

01. "ඌනතාවය" පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය සකස්කොට ඇති නිර්වචනය සඳහන් කරන්න.

02. ප්‍රජා මූලික පුනරුත්ථාපනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය සකස්කොට ඇති නිර්වචනය සඳහන් කරන්න.

03. ප්‍රජා මූලික පුනරුත්ථාපනයේ දක්නට ලැබෙන අංග පහක් නම් කරන්න.

04. ප්‍රජා මූලික පුනරුත්ථාපනය වර්තමානයේ නිර්වචනය වන්නේ ප්‍රජා සංවර්ධන වැඩ සටහනක් ලෙස වන අතර එයට විවිධ අංග හයක් (6) ඇතුලත් වේ. ඉන් පහක් (5) නම් කරන්න.

05. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් පුනරුත්ථාපය කිරීමේ දී සාමාන්‍ය පාසලක පන්ති කාමර ගුරුවරයාගේ භූමිකා පහක් (5) සඳහන් කරන්න.

06. 'සමාජ සචලනය' කෙටියෙන් පැහැදිලි කරන්න.

07. දුබලතා සහිත අයගේ පුනරුත්ථාපනයේ දී දේශපාලන සහභාගිත්වයේ දීර්ඝකාලීන ප්‍රතිඵල පහක් (5) නම් කරන්න.

08. "උත්ථාපනය" සහ "පුනරුත්ථාපනය" යන වදන් වල වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## දෙවන කොටස

09. i. "දුබලතාවය" යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 06)

ii. දුබලතාවයේ වෛද්‍යමය ආකෘතිය එක් උදාහරණයක් සහිතව විස්තර කරන්න. (ලකුණු 07)

iii. දුබලතාවයේ සමාජයීය ආකෘතිය එක් උදාහරණයක් සහිතව විස්තර කරන්න. (ලකුණු 07)

10. i. ප්‍රජා මූලික පුනරුත්ථාපනයේ ප්‍රාථමික අරමුණු මොනවාද? (ලකුණු 04)

ii. ප්‍රජා මූලික වැඩ සටහනක ප්‍රධාන ක්‍රියාකාරකම් වර්ගීකරණය කරන්නේ කෙසේ ද? (අඩුම වශයෙන් වර්ගීකරණ හයක් (6) දක්වන්න. (ලකුණු 06)

iii. ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩ සටහන් තුලින් දුබලතා ඇති අය බලවත්ත කිරීමේ ප්‍රවේශ පහක් (5) සඳහන් කොට, ඉන් එකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

11. i. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් පුනරුත්ථාපනය කිරීමේ දී පවුල සතු භූමිකාව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 07)

ii. දුබලතා සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමේ දී ප්‍රජාව සතු භූමිකාව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 07)

iii. ප්‍රජා සහභාගිත්වය යනු පුනරුත්ථාපන කණ්ඩායමේ සියලුම පුද්ගලයින්ට සමාන තත්වයන් ලැබෙන ක්‍රියාවලියකි. උදාහරණ සහිතව "ප්‍රජා සහභාගිත්වය" විස්තර කරන්න. (ලකුණු 06)

12. i. ක්‍රියාකාරිත්වය, දුබලතාවය සහ සෞඛ්‍යය පිළිබඳ ජාත්‍යන්තර වර්ගීකරණයට අනුව දුබලතා සංකල්පයේ නම නිර්වචනය විස්තර කරන්න. (ලකුණු 10)

ii. දේශපාලන හා ආර්ථික ප්‍රවේශය බොහෝ බලසම්පන්න වන අතර එය දේශීය ආර්ථිකයට මෙන්ම දුබලතා ඇති අයගේ සංස්කෘතික ජීවිතයට ද බලපෑම් ඇති කරයි. මෙය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

13. i. 'විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ළමයින් වඩාත් සාර්ථක ලෙස පාසලේ සිට පශ්චාත් පාසල් පරිසරයකට යාමට සුදුසු සේවාවන් සැලසුම් කිරීම හා ඒවා සැපයීම පාසල සතු වගකීමකි.' ඉහත මාතෘකාව ගැන පාසල් සඟරාවට ලිපියක් ලියන්න.

(ලකුණු 12)

ii. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින් සඳහා රැකියා සඳහා පුද්ගලානුබද්ධ සැලසුම්,(IPE) පාසල විසින් සංවර්ධනය කල හැක්කේ කෙසේ ද?

(ලකුණු 08)

14. දුබලතා ඇති අය ගැන සලකමින් පහත මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.

i. මානව අයිතීන් පිළිබඳ විශ්ව ප්‍රකාශනය

ii. දුබලතාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය

iii. පුනරුත්ථාපනය

iv. ස්ව සහායක කණ්ඩායම් (SHGs)

හිමිකම් ඇවිරිණි.